*සැ. යු.* - 2018.11.30 දින පළ වූ අංක 2,100 දරන *ගැසට් පත්‍රයේ* I:III කොටස සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,101 - 2018 දෙසැම්බර් මස 07 වැනි සිකුරාදා - 2018.12.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඳුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 දෙසැම්බර් මස 28 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 දෙසැම්බර් මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1 - B 81475— 5,403 (2018/12)

# තනතුරු - ඇබෑර්තු

## ආණමඩුව ප්‍රාදේශීය සභාව

ආණමඩුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති ආණමඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය වසර තුනකට වැඩි ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

Z

| *අනු. අංකය* | *තනතුරු නාමය හා ශ්‍රේණිය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්, වෙනත් සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|
| 01 | බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු - III (මෝටර් ග්‍රේඩර් සඳහා) | 01 | 3/2016 රා.ප.ච. අනුව පී.එල්. 3-2016 රු. 25,790- 10 x 270- 10 x 300 - 10 x 330- 12 x 350 - රු. 38,990 | 01. *අධ්‍යාපන සුදුසුකම් :*<br><br>*බාහිර අයදුම්කරුවන් සඳහා -*<br><br>*(අ)* අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06ක් සමත්වීම, (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වතාවක දී විෂයන් 05 ක් සමත්විය යුතුය.<br><br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා -*<br><br>*(ආ)* දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු (PL1, PL2 වැටුප් ක්‍රමය හිමි) අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය.<br><br>*(ඇ)* අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.<br><br>02. *ශිල්පීය නිපුනතාවය :*<br><br>තාර බර හොන්ඩර 34 ට වැඩිබර මෝටර් වාහන සහ බර ට්‍රේලර්, මගීන් 32 කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයන් ලබා තිබිය යුතුය. (A පන්තියේ රියැදුරු බලපත්‍රයක් තිබිය යුතුයි.) අමතර සුදුසුකම් සඳහා විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.<br><br>03. *පළපුරුද්ද :*<br><br>අවම වශයෙන් වසර තුනක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සේවා සහතික මගින් සනාථ කළ යුතුයි.) |

| අනු. අංකය | තනතුරු නාමය හා ශ්‍රේණිය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම්, වෙනත් සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|---|---|---|
| 02 | විදුලි කාර්මික - III | 01 | 3/2016 රා.ප.ච. අනුව පී.එල් 2-2016 රු. 25,250 -10 x 270 -10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 | 01. *අධ්‍යාපන සුදුසුකම් :*<br>බාහිර අයදුම්කරුවන් සඳහා -<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාග යේදී යටත් පිරිසෙයින් විෂයන් දෙකක් සමත් වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයන් හැර)<br>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා -<br>පළාත් රාජ්‍ය සේවයේ ආණමඩුව ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය.<br>02. ශිල්පීය නිපුනතාවය -<br>රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ජාතික පුහුණු ආයතනයක හෝ තෘතීය ආයතනය විසින් පිළිගත් ආයතනයක විදුලි කාර්මික ශිල්පය පිළිබඳ පුහුණු සහතිකය (N.V.Q) 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.<br>03. *පළපුරුද්ද :*<br>විදුලි කාර්මික ශිල්පය පිළිබඳ වසර දෙකක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සේවා සහතික මගින් සනාථ කළ යුතුය.) |
| 03 | නලළිං පොම්ප කාර්මික - III | 01 | 3/2016 රා.ප.ච. අනුව පී.එල් 2-2016<br>රු. 25,250 10 x 270- 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 | 01. *අධ්‍යාපන සුදුසුකම් :*<br>බාහිර අයදුම්කරුවන් සඳහා :-<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාග යේ දී යටත් පිරිසෙයින් විෂයන් දෙකකින් (02) සමත් විය යුතුය.<br>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා -<br>පළාත් රාජ්‍ය සේවයේ ආණමඩුව ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය.<br>02. *ශිල්පීය නිපුනතාවය .-* රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ජාතික පුහුණු ආයතනයක හෝ තෘතීය ආයතනය විසින් පිළිගත් ආයතනයක නලළිං පොම්ප කාර්මික ශිල්පය පිළිබඳ පුහුණු සහතිකය (N.V.Q) 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.<br>03. *පළපුරුද්ද .-* නල ළිං පොම්ප කාර්මික ශිල්පය පිළිබඳ වසර දෙකක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සේවා සහතික මගින් සනාථ කළ යුතුය.) |

| *අනු. අංකය* | *තනතුරු නාමය හා ශ්‍රේණිය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්, වෙනත් සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|
| 04 | සෞඛ්‍ය කම්කරු - III | 02 | 3/2016 රා.ප.ච. අනුව පී.එල් 1-2016 රු. 24,250-10 x 250 - 10 x 270-10 x 300 -12 x 330 - රු. 36,410 | (අ) *බාහිර අයදුම්කරුවන් සඳහා* .- අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී යටත් පිරිසෙයින් විෂයන් දෙකක් සමත් වීම.<br>(ආ) *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා* .-<br>අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවාගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. |
| 05 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු - III | 06 | 3/2016 රා.ප.ච. අනුව පී-එල්-1-2016 රු. 24,250 - 10 x 250 - 10 x 270 -10 x 300- 12 x 330 - රු. 36,410 | (අ) *බාහිර අයදුම්කරුවන් සඳහා* -<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයන් දෙකක් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර)<br>(ආ) *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා* :-<br>අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවාගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. |

*අවශ්‍ය වෙනත් සුදුසුකම්* :-

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික විය යුතු ය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර තුනක ආණමඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (පදිංචිය ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මගින් අද ාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර තිබිය යුතුය.)

(iii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.

(iv) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

(v) .දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවෙක් නොවිය යුතු ය.

(vi) දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු අයෙකු නම් හෝ මෙම බඳවා ගැනීමේ පටිපාටිය වයඹ ආණ්ඩුකාර අනුමත කරන දින වන විට අනියම්/ආදේශක/තාවකාලික සේවයේ යෙදී සිටි අයෙකුට වයස් සීමාවක් බල නොපැවැත්වෙන අතර, ඔහු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියළු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.

*සේවා කොන්දේසි* :-

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

(ii) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(iii) පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.

iv. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලටද,මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තු රෙගුලාසි වලටද රජයේ හෝ පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරන වෙනත් රෙගුලාසි හා නියෝග වලටද, පළාත් මුල්‍ය රීති රෙගුලාසි වලටද අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටිය යුතු ය.

*අයදුම් කළ යුතු ආකාරය -*

මෙහි පහත සඳහන් කර ඇති ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත් සකස් කර 2018.12.20 වැනි දිනට, පෙර ''ලේකම්, ආණමඩුව ප්‍රාදේශීය සභාව, ආණමඩුව'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුය. කවරයේ වම් පස උඩ කෙළවරේ අදාළ තනතුරේ නම සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. එක් එක් තනතුරු සඳහා වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත්‍ර සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතු වේ :-

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික;
(iii) ශිල්පීය නිපුණතා, ප්‍රවීණතා හා පළපුරුද්ද පිළිබඳ සහතික (පී. එල් 3 හා පීඑල් 2 තනතුරු සඳහා);
(iv) ජාතික හැඳුනුම්පතේ පිටපත් හෝ වලංගු රියදුරු බලපත්‍රයේ පිටපත;
(v) ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ පදිංචිය සනාථ කිරීමේ ග්‍රාම නිලධාරී නිකුත් කළ සහිතකය;
(i) මෝටර් ග්‍රේඩර් සඳහා බරවාහන යන්ත්‍ර ක්‍රියාකරු වසර තුනක හා විදුලි කාර්මික, නලළිං පොම්ප කාර්මික තනතුර සඳහා වසර දෙකක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සේවා සහතික මගින් සනාථ කළ යුතු ය.);
(vii) මෑතක දී ලබා ගත් චරිත සහතික දෙකක්.

*බඳවා ගැනීමේ ක්‍රමවේදය :-*

01. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත බඳවා ගැනේ. (බරවාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් වාහන නඩත්තුව පිළිබඳ මාර්ග නීති වාචික පරීක්ෂණයකට හා බර වාහන පැදවීමේ ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.)

02. මෙම අයදුම්පත්‍ර කැඳ වූ පසු හෝ කැඳවන අතරතුරේ දී හෝ බඳවා ගැනීම් ප්‍රමාද කිරීමේ හෝ වෙනස් කිරීමේ හෝ අවලංගු කිරීමේ බලය ආණමඩුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

එල්. එම්. සී. එස්. එන්. කේ. ගලබඩගම,
ලේකම්,
ආණමඩුව ප්‍රාදේශීය සභාව.

2018 ක් වූ නොවැම්බර් මස 16 වැනි දින,
ආණමඩුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**ආණමඩුව ප්‍රාදේශීය සභාවේ —————— තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. (අ) නම :——————————————
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————

02. ස්ථිර පදිංචි ලිපිනය :——————————————

03. දිස්ත්‍රික්කය :———— ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————

04. උපන් දිනය අවුරුද්ද:————. මාසය:————. දිනය:————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :————

06. දුරකථන අංකය :————

07. ස්ත්‍රී/පුරුෂ භාවය :————

08. අයදුම්පත් භාර ගන්නා 2018.12.20 දිනට වයස :————
අවු :————, මාස:————, දින :————.

09 විවාහක/අවිවාහක බව :————

10. ඔබ ශ්‍රී ලාංකිකයෙක් ද යන වග :————

11. අධ්‍යාපන සුදුසුකම් :————
i. සමත් වූ වසර /ශ්‍රේණිය :————
ii. අ.පො.ස සා. පෙළ විභාගය

විභාග අංක :————

විභාගය පැවැත් වූ වර්ෂය හා මාසය :————

සමත් වූ විෂයයන් :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

12. වෘත්තීය සුදුසුකම් : (සහතික මගින් සනාථ කළ යුතුයි) ————

13. සේවා පළපුරුද්ද: ————

14. අමතර සුදුසුකම් :————

15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ සිටී ද? ————

එසේ නම් හේතු :————

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් කිසියම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව දනිමි.

————;
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

***දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය***

.................................................. මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ. .....................................කු වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර කිසිදු දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි.

...........................................................;
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

12-196

**වත්තල මාබෝල නගර සභාව**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

වත්තල මාබෝල නගර සභාව තුළ දැනට පුරප්පාඩුව පවතින තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු | 01 | රු. 24,250- 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 රා. ප. ච. 03/2016 හි PL 1- 2016 (රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 3/2016 හි උපලේඛන අංක II අනුව වැටුප් ගෙවනු ලැබේ.) හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. තනතුරේ රාජකාරි සිදු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය. |

**සටහන :** පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙල අනුව පත්වීම කරනු ලබන අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහි දී සලකා බලනු ලැබේ.
බඳවා ගැනීමේ ක්‍රමය - 100% විවෘත බඳවා ගැනීමකි.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 02 | රියදුරු | 02 | රු. 25,790 - 10 x 270- 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 (රා.ප.ච. 03/2016හි PL 03-2016 (රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 3/2016 හි උපලේඛන අංක II අනුව වැටුප් ගෙවනු ලැබේ.) හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළු සම්මාන සාමාර්ථ 02 ක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම(එක් වරක දී විෂයයන් 05 ක් අවම වශයෙන සමත්ව තිබිය යුතු ය.)<br>පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර 03 කට පෙර අවම වශයෙන් සී සහ සී 1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතු ය.)<br>මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුම තිබිය යුතු ය.<br>බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරකු ලෙස අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතු ය.)<br>*කායික සුදුසුකම් :*<br>අවම උස අඩි 05 ක් විය යුතුය. තව ද දිවා කාලයේ හා රාත්‍රී කාලයේ සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මඟින් ඒ බැව් සනාථ කළ යුතු ය. |

(**සංලක්ෂය** - ආයතනයේ අවශ්‍යතාවය අනුව පවතින පුරප්පාඩු බර වාහන පැදවීමේ නිපුණතාවය සහිත රියදුරන්ගෙන් පිරවීමට ඇති අවස්ථාවල දී බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොණ්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32 කට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම් ඒ 1 සහ සී 1 පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී සහ ඩී 1 පන්තියේ බලපත්‍රයක් *නැතහොත්* තාර බර හොණ්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 කට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ ඒ පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ඩී පන්තියේ බලපත්‍රයක්) මූලික සුදුසුකම වශයෙන් නියම කිරීමට පත්වීම් බලධාරියා කටයුතු කරනු ඇත.

*බඳවා ගැනීමේ ක්‍රමය* .- 100% විවෘත බඳවා ගැනීමකි.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය (මාසික)* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 03 | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 01 | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300- 12 x 330 රු. 36,410 (ර. ප. ච. 03/2016 හි PL 1- 2016) (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක II අනුව වැටුප් ගෙවනු ලැබේ) හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | 8 වන ශ්‍රේණිය ( 9 වසර) සමත් වී තිබිය යුතුය. තනතුරේ රාජකාරි සිදු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය. |

*සටහන* :-පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහි දී සලකා බලනු ලැබේ.
බඳවා ගැනීමේ ක්‍රමය - 100% විවෘත බඳවා ගැනීමකි.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය (මාසික)* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 04 | විදුලි කාර්මික | 01 | රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 (රා.ප.ච. 03/2016 හි PL 2-2016) (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ - 3/2016 හි උපලේඛන අංක II අනුව වැටුප් ගෙවනු ලැබේ.) හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබීම. (මින් විෂයයන් 05ක් එකවර සමත් වී තිබිය යුතුය.) *වෘත්තීය සුදුසුකම්* : අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා ගෙන තිබීම සහ අවම වශයෙන් ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුය.) |

**සටහන** : පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බලනු ලැබේ.

*බඳවා ගැනීමේ ක්‍රමය.* - 100% විවෘත බඳවා ගැනීමකි.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 05 | පුස්තකාල සහායක | 01 | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 රා.ප. ච. 03/2016 හි PL1-2016 (රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 3/2016 හි උපලේඛන අංක 11 අනුව වැටුප් ගෙවනු ලැබේ.) හතරවන වැටප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත්ව තිබීම. (මින් විෂයයන් පහක් (05) එකවර සමත් විය යුතුය.<br><br>තනතුරේ රාජකාරි සිදු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයයෙන් යුක්ත විය යුතුය. |

*සටහන* .- පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙල අනුව පත්වීම කරනු ලබන අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බලනු ලැබේ. බඳවා ගැනීමේ ක්‍රමය - 100% විවෘත බඳවා ගැනීමකි.

1. *බඳවා ගැනීම සඳහා පොදු තොරතුරු :*

   i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
   ii. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
   iii. යහපත් චරිතයකින් හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝගතාවයකින් යුක්ත විය යුතුය.
   iv. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
   v. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.
   vi. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් 2018.10.30 වන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

02. 2013.01.01 දිනට පෙර හා පසු අනුමත වී ඇති බඳවා ගැනීම් පරිපාටිවල සඳහන් ඇතැම් කරුණු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද 2013.01.01 දිනට වත්තල මාබෝල සභාවේ අනුමත කාර්ය මණ්ඩලය වාර්තාවේ සඳහන් තොරතුරු හා අංක 1859/32 හා 2014.04.24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බලතල පැවරීම උපලේඛනයේ සඳහන් තොරතුරු සමඟ නොගැළපෙන අවස්ථාවන්හිදී බඳවා ගැනීම් පරිපාටිවල සඳහන් අදාළ කොන්දේසි වෙනුවට ඉහත අවස්ථා දෙකෙහි කොන්දේසි අදාළ පරිදි ආදේශ වනු ලැබේ.

03. අදාළ බඳවා ගැනීම් පරිපාටිවල විධිවිධාන අනුව එක් එක් තනතුරට අදාළව විධිමත් ලිඛිත පරීක්ෂණ/වාචික පරීක්ෂණ ප්‍රයෝගික පරීක්ෂණ/ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ/සම්මුඛ පරීක්ෂණ යන පරීක්ෂණ වලින් එකකට හෝ කිහිපයකට හෝ සියල්ලටම අයදුම්කරුවන් යොමු කරනු ලබන අතර එහිදී ලබා ගන්නා සියලුම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ. (කිසියම් අයදුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු සමාන ලකුණු සංඛ්‍යාවක් ලබා ඇති විට ඒ අතරින් බඳවා ගනු ලබන තැනැත්තා කවුරුන්ද යන්න වත්තල මාබෝල නගර සභාවේ නාගරික ලේකම් විසින් තීරණය කරනු ලබන ආකාරයට විය යුතුය)

04. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ /ප්‍රායෝගික/ලිඛිත පරීක්ෂණයට කැඳවූ පමණින් හෝ එම පරීක්ෂණවලට භාජනය කළ පමණින් එම අයදුම්කරු බඳවා ගැනීම් සඳහා සුදුස්සකු ලෙස නොසළකනු ලැබේ.

05. අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මේ නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම වත්තල මාබෝල නගර සභාවේ ලේකම් සතුය.

06. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු හෝ දඬුවම් ලැබූවෙකු හෝ නොවිය යුතුය.

07. වත්තල මාබෝල නගර සභාවේ දැනටමත් ව්‍යාපෘති/කොන්ත්‍රාත් පදනම මත සේවය කරන්නන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

08. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

09. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් හිමිය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ.

II. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන්නේය.

III. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජය හෝ පළාත් සභා විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසි වලට ද අනුකූලව ක්‍රියාත්මක කිරීමට සේවකයින් බැඳී සිටිය යුතුය.

10. *බඳවා ගැනීමේ ක්‍රමය හා අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

I. සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

II. අයදුම්කරුවන් තමා විසින්ම සකසා ගත් අයදුම්පත්‍රයක් 2018.12.28 දිනට පෙර ලැබෙන සේ ලේකම්, වත්තල මාබෝල නගර සභාව, වත්තල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

III. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කර අයදුම්පත් එවිය යුතුය.

IV. තනතුරු කිහිපයක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුය.

V. අයදුම්පත සමග පහත සඳහන් සහතික වල පිටපත් අමුණා එවිය යුතුය.

*a.* ජාතික හැඳුනුම්පත,
*b.* උප්පැන්න සහතිකය,
*c.* අධ්‍යාපන සහතික,
*d.* පදිංචිය සහතික කිරීම පිණිස මාස 03 ක් ඇතුළත ලබා ගත් පදිංචි වීමේ සහතිකය,
*e.* මෑතක දී ලබාගත් චරිත සහතික 03 ක් (මින් එක් සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගෙන් ලබා ගත් එකක් විය යුතුය.)

VI. නියමිත දිනට පසු ලැබෙන සියලු ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ අතරතුරදී බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම දැන්වීම අවලංගු කිරීමේ බලතල වත්තල මාබෝල නගර සභාවේ ලේකම් සතුය.

12. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් යථා කාලයේ දී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් වෙත කිසිදු දැනුම් දීමක් සිදු කරනු නොලැබේ.

13. අයදුම්කරු විසින් සපයන තොරතුරු අසත්‍යය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්කරු නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් හෝ නොගෙවා සේවයෙන් පහ කිරීමට කටයුතු කිරීමේ බලතල වත්තල මාබෝල නගර සභාවේ ලේකම් සතුය.

ඩී. පී. එච්. සමරවික්‍රම,
ලේකම්,
වත්තල මාබෝල නගර සභාව.

වත්තල මාබෝල නගර සභාව.

12-197

---

## කඩුගන්නාව නගර සභාව

### මධ්‍යම පළාත් සභාවේ කඩුගන්නාව නගර සභාවේ ප්‍රාථමික ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම

මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ කඩුගන්නාව නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති කඩුගන්නාව හා යටිනුවර පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල වසර තුනකට නොඅඩු ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු නාමය | ශ්‍රේණිය | සේවක ගණය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | සුදුසුකම් |
|---|---|---|---|---|---|
| (01) රියැදුරු | III | ප්‍රාථමික ශිල්පීය | 01 | රා.ප.ච. අංක 3/2016<br>PL -03-2016<br>රු. 25,790 - 10 x 270 - 10 x 300- 10 x 330 - 12 x 350 - රු. 38,990<br>මුල් පත්වීම් දින සිට රා.ප.ච. 3/2016<br>II උපලේඛනයේ පරිදි රු. 20,462 වැටුප් පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ. | 01. *අධ්‍යාපන සුදුසුකම් :*<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05ක් එක් වරක දී සමත් වී තිබිය යුතුයි.<br><br>02. *වෘත්තීය සුදුසුකම් :*<br><br>තාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියැදුරු බලපත්‍රයක් තිබීම. (බඳවා ගන්නා දිනට වසර 03 කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ''ඒ'' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව ''බී'' පන්තියේ වාහන බලපත්‍රයක් ලබා තිබීම)<br><br>03. *පළපුරුද්ද :*<br><br>මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර තුනක පළපුරුද්ද ලබා තිබීම (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතු වේ.)<br><br>04. *කායික සුදුසුකම් :*<br><br>1 සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.<br><br>II. අවම උස අඩි 05 අඟල් 2 1/2 ක් විය යුතුය.<br><br>05. *වෙනත් :*<br><br>1. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.<br><br>ii බඳවා ගැනීමේ අනුපාතය<br><br>විවෘත 70%<br>සීමිත 30% |

| *තනතුරු නාමය* | *ශ්‍රේණිය* | *සේවක ගණය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසික)* | *සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| | | | | | 06. *බඳවා ගැනීමේ ක්‍රමය :*<br>(i) විවෘත බඳවා ගැනීම :<br>ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන් ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.<br>(ii) සීමිත බඳවා ගැනීම - කායික මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන, වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමග ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයක දී සුදුසුකම් ලබා ගත යුතුය. |
| (02) සෞඛ්‍ය කම්කරු | III | ප්‍රාථමික ශිල්පීය නොවන | 05 | රා.ප.ච. අංක 3/2016 PL 01 - 2016 රු. 24,250 -10 x 250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - රු. 36,410 මුල් පත්වීමේ දින සිට රා.ප.ච. ලේ. 3/2016 II උපලේඛනය පරිදි රු. 19,242 වැටුප් පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ. | 01. *අධ්‍යාපන සුදුසුකම් :*<br>(i) අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05 ක් එකවරකදී සමත් වී තිබිය යුතුයි.<br>(ii) ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොසිටියහොත් අධ්‍යාපන සුදුසුකම 5 ශ්‍රේණිය සමත් වීම දක්වා අඩු කරනු ලැබේ.<br>02. *බඳවා ගැනීමේ ක්‍රමය :*<br>සුදුසුකම් පළපුරුද්ද හා පෞරුෂය පරීක්ෂා කිරීම සඳහා පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. |

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින්විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්වීම ලබා මසක් ඇතුළත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පරිදි ප්‍රතිඥා/දිවුරුම් දී අත්සන් කළ යුතුය. එසේම එහි IV වැනි පරිච්ඡේදයේ සඳහන් භාෂාව පිළිබඳ විධිවිධාන පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

iii. මෙම බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලටද, මධ්‍යම පළාත් සභාව හෝ කඩුගන්නාව නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි සහ නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

iv. තෝරාගනු ලබන්නන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වන අතර, එම කාලය තුළ වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායක තත්වයක නොමැති වුවහොත් සේවය අවසන් කරනු ලැබේ.

v. දැනටමත් මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන්නන් පමණක් එක් අවුරුදු පරීක්ෂණ කාලයකට යටත්වේ.

04. *වෙනත් පොදු සුදුසුකම් :*

i. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට හා සීමිත බඳවා ගැනීම් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

ii. දැනට කඩුගන්නාව නගර සභාවේ තාවකාලික/අනියම්/ආදේශක පදනම මත සේවයේ නියුතු සේවකයින්ට වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

iii. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු හෝ රජයේ සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.

